සැ.යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2022 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,278 - 2022 අප්‍රේල් මස 29 වැනි සිකුරාදා - 2022.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 776 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 780 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 785 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 789 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 මැයි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මැයි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


775 - B 82339 - 5,403 (2022/04)

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොණරාගල**

මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව අධිකරණයට ඉදිරිපත් කර ඇති රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2022.05.28 වැනි දින පෙ. ව. 9.30 ට** අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් වන භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දැක්වීමට අපේක්ෂා කරන තැනැත්තන් වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.00 ට පෙර ස්වකීය හිමිකම් අධිකරණ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

02. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.00 සිට පෙ. ව. 9.30 තෙක් වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා අදාළ මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් සතියක් ඇතුළත ඉවත්කර ගත යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

05. භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන පුද්ගලයන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා අනිවාර්යයෙන් ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත්කර ඇති ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය රැගෙන ආ යුතු ය.

06. වෙන්දේසියට සහභාගි වන සියලුදෙනා දැනට පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු බැවින්, සියලුම දෙනා මුඛ ආවරණ පැළඳිය යුතු මෙන් ම, පුද්ගල දුරස්ථභාවය රඳවා ගනිමින් වෙන්දේසියට සහභාගි විය යුතු ය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම්, වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
මොණරාගල.

2022 අප්‍රේල් මස 05 වැනි දින,
මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 94635 | සිදුරු සහිත ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 02. | 87127 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 03. | 94892 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 04. | 94404 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | ඇලුමිනියම් කළ | 01 |
| 05. | 90730 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 06. | 94455 | ඇලුමිනියම් කළ | 01 |
| | | ඇලුමිනියම් පොඩි කළ | 01 |
| 07. | 94614 | ඇලුමිනියම් මුට්ටි | 02 |
| 08. | 94824 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 09. | 86773 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 10. | 99554 | ලී මිට සහිත පොරෝ | 01 |
| 11. | 90372 | අත් පොරව | 01 |
| 12. | 95004 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | සාස්පාන් | 02 |
| 13. | 95834 | අධි ශීතකරණ | 01 |
| 14. | 99555 | ලී මිට සහිත පොරෝ | 01 |
| 15. | 92519 | හීරෝ වර්ගයේ පා පැදි | 01 |
| 16. | 99840 | සිදුරු සහිත ඇලුමිනියම් මුට්ටි | 01 |
| 17. | 99662 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 18. | 99670 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | ඇලුමිනියම් කළ | 01 |
| 19. | 99191 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 20. | 96707 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 21. | AR/181/21 | ඇලුමිනියම් කළ | 01 |
| 22. | 92271 | ඉල්ලංකුරු | 01 |
| 23. | 99950 | යකඩ සවල් | 01 |
| | | ඇඳුම් උදලු | 01 |
| | | උදලු | 01 |
| 24. | 97868 | උදලු | 01 |
| 25. | 96737 | උදලු | 01 |
| 26. | 97095 | උදලු | 01 |
| 27. | 99113 | උදලු | 01 |
| 28. | 92582 | උදලු | 01 |
| 29. | 87219 | උදලු | 01 |
| 30. | 93206 | උදලු | 01 |
| 31. | 92781 | උදලු | 01 |
| 32. | 96365 | උදලු | 01 |
| 33. | 98133 | උදලු | 01 |
| 34. | 58 | පොරව | 01 |
| 35. | 73 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 36. | 95240 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 37. | 98545 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 38. | 94406 | කළ | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|---|
| 39. | 98847 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | තාච්චි | 01 |
| | | සිදුරු සහිත ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | නිකල් පිඟන් | 01 |
| 40. | 96445 | කැති | 01 |
| 41. | 99006 | කැති | 01 |
| 42. | 99004 | කැති | 01 |
| 43. | 96151 | කැති | 01 |
| 44. | 86150 | කැති | 01 |
| 45. | 96054 | අත් කියත් | 01 |
| | | මිටි | 01 |
| | | මුළුමට්ටම් | 01 |
| | | නියන් | 02 |
| 46. | 92090 | කැති | 01 |
| 47. | 93813 | කැති | 01 |
| 48. | 92689 | කැති | 01 |
| 49. | 92801 | කැති | 01 |
| 50. | 99227 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 51. | 94417 | සිදුරු සහිත ඇලුමිනියම් කුඩා ස්ටීමර් ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | ඇලුමිනියම් කළ | 01 |
| 52. | 99373 | සිදුරු සහිත ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | ඇලුමිනියම් කළ | 01 |
| 53. | 99005 | කැති | 01 |
| 54. | 99198 | කොක්ක නොමැති සිදුරු සහිත යකඩ බාල්දි | 01 |
| 55. | 94463 | ඇලුමිනියම් කළ | 01 |
| 56. | 99003 | කැති | 01 |
| 57. | - | නඩු අංක අපැහැදිලි හා අංක මැකී ඇති විවිධ නඩු අංක යටතේ අත් ට්‍රැක්ටර් බෙල්ට් සහ හැඬල් (යතුරු) තොගයක්. | |

04-731

---

## මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය

### නඩු භාණ්ඩ වෙන්දේසිය

මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ **2022 ක් වූ මැයි මස 22 වැනි දින පෙ. ව. 9.00 ට** මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ කටයුතු යොදා ඇත.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ඇතිව එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි අදාළ වෙන්දේසි භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවීම් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. මිලදී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේදී ම අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු ය.

07. සියලුම භාණ්ඩ ගැණුම්කරුවන් ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි අනන්‍යතා පත්‍රයක් රැගෙන ඒම අනිවාර්ය වේ.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
මාවනැල්ල.

2022 අප්‍රේල් මස 06 වැනි දින,
මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2022.05.22 දින වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය | |
|---|---|---|---|
| 01. | 82236 | රෙගියුලේටරය සහිත වට 3කින් යුත් ගෑස් ලිප් | 01 |
| 02. | | ඇලුමිනියම් හැලි | 01 |
| 03. | | ලීටර් 12.5 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් | 01 |
| 04. | 81173 | ප්ලාස්ටික් බැරල් | 01 |
| 05. | | වට 04කින් යුත් රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 06. | A/16232/17 | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 07. | 81185 | සවල් | 01 |
| 08. | 81456/21 | උදලු | 01 |
| 09. | 81456/21 | අලවංගු | 01 |
| 10. | 81271 | සවල් | 01 |
| 11. | 78561 | හිස් ඇලුමිනියම් මුට්ටි | 01 |
| 12. | 82173 | ප්ලාස්ටික් බාස්කට් | 01 |
| 13. | 76288 | වට 2 කින් යුත් ගෑස් ලිප් | 01 |
| 14. | | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 15. | | ප්ලාස්ටික් බේසම් | 01 |
| 16. | | ප්ලාස්ටික් බාල්දි | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය | |
|---|---|---|---|
| 17. | 78678 | උදලු | 01 |
| 18. | 82650 | ප්ලාස්ටික් බකට් | 01 |
| 19. | 83066 | ප්ලාස්ටික් බැරල් | 01 |
| 20. | | ප්ලාස්ටික් බේසම් | 01 |
| 21. | | වට 4 කින් යුත් ගෑස් ලිප හා රෙගියුලේටර් | 01 |
| 22. | | ලිට්‍රෝ 12.5 kg ගෑස් සිලින්ඩර් | 01 |
| 23. | 80834 | උදලු | 01 |
| 24. | | අලවංගු | 01 |
| 25. | | ගල් කටු | 01 |
| 26. | | මිටි | 01 |
| 27. | | වතුර මෝටර් | 01 |
| 28. | | දුඹුරුපාට වයර් කැබලි | 01 |
| 29. | | තන්ගුස් ලණු | 01 |
| 30. | 78483 | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 31. | අංක රහිත | වීදුරු බෝතල් | 300 |
| 32. | අංක රහිත | සාමාන්‍ය බූලි | 100 |
| 33. | අංක රහිත | ලොකු බූලි | 75 |

04-729

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - පිලැස්ස

රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2022.05.07 වැනි දින පෙ. ව. 10.00 ට** පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් දක්වන්නෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ආර්. කේ. ආර්. ජයවර්ධන,
මහෙස්ත්‍රාත්,
පිලැස්ස.

2022 අප්‍රේල් මස 07 වැනි දින,
පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### භාණ්ඩ උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | 80656 | යකඩ සවල් 01යි |
| 02. | 80657 | යකඩ සවල් 01යි |
| 03. | 80658 | යකඩ සවල් 02යි |
| 04. | 83401 B. 08/17 | Innovex වර්ගයේ අගල් 32 TV 01යි |
| 05. | AR159/21 | II. ෆොන්කොම් වර්ගයේ ජංගම දුරකථනය<br>III. ස්පෝර්ට් වර්ගයේ පාපැදිය |
| 06. | AR 433/20 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 07. | 78671 | 41 ශ්‍රී 5676 ලොරි රථය - කැබලි ලෙස |
| 08. | 81675 | 41 - 6335 ලොරි රථය - කැබලි ලෙස |
| 09. | 79357 | 48 - 5248 රථය |
| 10. | AR 264/20 | NWWL 6189 බජාජ් පල්සර් යතුරු පැදිය |
| 11. | AR 266/20 | 144-8036 යතුරු පැදිය - කැබලි ලෙස |
| 12. | AR 263/20 | 94 - 1960 හොන්ඩා යතුරු පැදිය - කැබලි ලෙස |
| 13. | AR 262/20 | NWMY 7214 බජාජ් CT 100 වර්ගයේ යතුරු පැදිය |
| 14. | 88423 | NWMU 1506 යතුරුපැදිය |

*භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ*

| | | |
|---|---|---|
| 15. | 01 | කාර්යාල සීනු 01 |
| 16. | 02 | ජල පෙරණ 01 |
| 17. | 03 | ජල ටැංකි 01 |
| 18. | 04 | ඇඳි සහිත ලී පුටු 08 |
| 19. | 05 | පරිගණක පුටු 01 |
| 20. | 06 | යතුරු ලියන 01 |
| 21. | 07 | විදුලිපංකා පාදස්තල 02 |

22. පස් කියුබ් 10 ක් (රාජසන්තක කරන ලද)

04-732

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වැලිමඩ**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණයේ නඩුවලට අදළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත ඇමුණුමේ සඳහන් භාණ්ඩ වර්ෂ **2022.05.19 වැනි දින පෙ. ව. 9.30** ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. එහි සඳහන්වන කිසියම් භාණ්ඩයක් හෝ භාණ්ඩ සම්බන්ධයෙන් හිමිකම් කියන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වෙන දිනට පෙර හෝ වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ලිඛිතව අධිකරණ රෙජිස්ට්‍රාර්වරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන ගැනුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු ය.

07. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසිය පවත්වන වේලාවේ දී ම එය ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

පමෝද ජයසේකර,
දිසා/විනිසුරු, මහෙස්ත්‍රාත්,
වැලිමඩ.

2022 අප්‍රේල් මස 21 වැනි දින,
වැලිමඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2022.05.19 වැනි දින ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

රාජසන්තක කළ නඩු භාණ්ඩ

| *අනු. අංකය* | *නඩු අංකය* | *අයිතමය* |
|---|---|---|
| 01. | 41888 | නයිලෝන් කඹ 01 |
| 02. | 41888 | උදලු 01 |
| 03. | 41888 | අලවංගු 01 |
| 04. | 43020 | සවල 01 |
| 05. | 38060 | උදලු 01 |
| 06. | 42341 | පොරව 01 |
| 07. | 42341 | අලවංගු 01 |
| 08. | 43233 | 5 kg ගෑස් සිලින්ඩර් 01 |
| 09. | 53592 | ලී ඉනිමගක් |
| 10. | 53592 | උදලු 01 |
| 11. | 51625 | 12.5kg ගෑස් සිලින්ඩර් 01 |
| 12. | 43153 | 12.5kg ගෑස් සිලින්ඩර් 01 |
| 13. | 43153 | ගෑස් ලිපක් හා රෙගියුලේටරයක් |
| 14. | 52636 | තනි ලිප සහිත ගෑස් ලිපක් |
| 15. | 52636 | 12.5kg ගෑස් සිලින්ඩර් 01 |
| 16. | 40968 | සවල් 01 |
| 17. | 44354 | තනිදොර සහිත සිංගර් ශීතකරණය |
| 18. | 41820 | තරාදි 01 |
| 19. | 45984 | උදළු |
| 20. | 45224 | ප්ලාස්ටික් ජල කරාමයක් |
| 21. | 51137 | ට්‍රැවල් ඇඩැප්ටර් 01 |
| 22. | 51145 | රී චාර්ජබල් විදුලි පන්දමක් |
| 23. | 54166 | ඔරේන්ජ් වර්ගයේ වයර් රෝලක් |
| 24. | 45423 | දුරකථන චාර්ජර් 01 |
| 25. | 45419 | දුරකථන චාර්ජර් 01 |
| 26. | 46094 | මල්ටි ප්ලග් 01 (Power extensible Code reel plug) |
| 27. | 45713 | මල්ටි සොකට් 01 |
| 28. | 54171 | යූරියා වර්ගයේ 50kg පොහොර මිටි 01 |
| 29. | 50915 | යූරියා වර්ගයේ 50kg පොහොර මිටි 01 |
| 30. | 51761 | අල පොහොර 50kg පොහොර මිටි 01 |
| 31. | 51136 | යූරියා වර්ගයේ 50kg පොහොර මිටි 01 |
| 32. | 51142 | 50kg පොහොර මිටි 01 |
| 33. | 50916 | 50kg පොහොර මිටි 01 |
| 34. | 51477 | 50kg පොහොර මිටි 01 |
| 35. | 51139 | 10kg පොහොර මිටි 01 |
| 36. | 54167 | සිමෙන්ති මිටි 01 |
| 37. | 54172 | සිමෙන්ති මිටි 01 |
| 38. | 54513 | සිමෙන්ති මිටි 01 |
| 39. | 55326 | සිමෙන්ති මිටි 01 |

04-1099

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2022 ජූලි මස 01 වැනි දින සිට 2023 ජුනි මස 30 දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - 2022/2023 වර්ෂය

2022 ජූලි මස 01 වැනි දින සිට 2023 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව, එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

(2) සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් කළයුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

(3) විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනත වම් කෙළවරෙහි "අංක............................................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන්, පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට **2022.06.02 දින පෙ.ව. 10.30** ට පෙර මහවැව ප්‍රාදේශීය ලේකම් ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

(4) ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

(5) **2022.06.02 වැනි දින පෙ.ව. 10.30** ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

(6) පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම **2022.07.04 දින පෙ. ව. 10.30** ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

(6) මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.
(දුරකථන අංකය : 032 -2254231, 0322252061).

එච්. එම්. නදීජා හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
මහවැව.

2022 අප්‍රේල් මස 19 වැනි දින,
මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

### *උපලේඛනය*

| *රා තැබෑරුම් අංකය* | *ග්‍රාමය* | *තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|
| 16 | අඩප්පරගම | 500 0 |
| 17 | මට්ටාකොටුව | 500 0 |
| 18 | තොඩුවාව (උතුර) | 1,000 0 |

04-787

**පුත්තලම දිස්ත්‍රික්කය**

නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

**රා තැබෑරුම් රේන්ද විකිණීම - 2022/2023 - වර්ෂය**

***2022.07.01 සිට 2023.06.30 දක්වා***

2022 ජූලි මස 01 වැනි දින සිට 2023 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක්ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රා තැබෑරුම් රේන්ද විකිණීම සඳහා වූ ටෙන්ඩර් **2022.05.30 වැනි දින පෙ. ව. 10.30** දක්වා ම විසින් භාරගනු ලැබේ.

02. ඔබගේ ටෙන්ඩරය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ටෙන්ඩර් පත්‍රයක සකස් විය යුතු අතර නියමිත ඇප තැන්පත් කුවිතාන්සියක් ද අදාළ ටෙන්ඩරයේ සඳහන් මිලෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුන් වම් කෙළවරේ ''අංක 01 මූදුකටුව රා තැබෑරුම'' හෝ ''අංක 02 කටුනේරිය රා තැබෑරුම'' සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි රා තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට **2022.05.30 වැනි දින පෙ.ව.10.30** ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. **2022 මැයි මස 30 වැනි දින පෙ.ව.10.30** ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම **2022.06.30 වැනි දින පෙ. ව. 10.30** ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අදළ විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. (032 - 2254486)

චතුරක ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

2022 ක් වූ අප්‍රේල් මස 19 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නාත්තන්ඩිය.

***උපලේඛනය***

| *තැබෑරුම් අංකය* | *ග්‍රාමය* | *තැන්පත් මුදල රු.* |
|---|---|---|
| 01. | මූදුකටුව | 1,000.00 |
| 02. | කටුනේරිය | 1,000.00 |

04-987

## හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### 2022/2023 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2022 ජූලි මස 01 වැනි දින සිට 2023 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා පහත දක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑ ම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙන් දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් 15% වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි අංක ................................. දරන ......................... රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කර **2022.05.26 වැනි දින පෙ.ව. 10.30** ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. 2022 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. **2022.05.26 වැනි දින පෙ.ව. 10.30** ට ටෙන්ඩර්පත්‍ර භාරගැනීම අවසන් කළ වහා ම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය හැකිය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන රා තැබෑරුම් නැවත විකිණීම **2022.06.27** වැනි දින **පෙ. ව. 10.30** ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූලව විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය. (දුරකථන අංක : 032-2223205/032-2222138).

බී. ඩබ්. එම්. එම්. එස්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්.

2022 අප්‍රේල් මස 21 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
හලාවත.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|
| හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 02 දරන කොට්ඨාසය | ඉච්චම්පිටිය | 2022.05.26 පෙ.ව. 10.30 | 2,000.00 |
| හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 03 දරන කොට්ඨාසය | කොට්ඨාසය තුළ වෙනත් සුදුසු ස්ථානයක් සොයා ගත යුතුය. | - එම - | 1,000.00 |
| උතුරු පිටිගල් කෝරළේ | ඔළිඳළුව | - එම - | 250.00 |

04-1037

මගේ අංකය : ARA/ADM/ADMIN/03/13/01.
2022.04.05

**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2022/2023 වර්ෂය

**2022 ජූලි මස 01 දින සිට 2023 ජුනි මස 30 දින දක්වා**

2022 ජූලි මස 01 වැනි දින සිට 2023 ජුනි මස 30 වැනි දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකට ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල පරිමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි අංක............. රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට **2022.05.27 වැනි දින පෙ.ව. 10.30** ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

5. **2022.05.27 වැනි දින පෙ.ව. 10.30** ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ තැබෑරුම් සඳහා නැවත විකිණීම **2022.06.27 වැනි දින පෙ. ව. 10.30** ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය. (032-4934343)

ඊ. ඒ. ඩී. එම්. අතුකෝරල,
ප්‍රාදේශීය ලේකම්,
ආරච්චිකට්ටුව.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් කළ යුතු මුදල රු.* |
|---|---|---|---|---|
| ආරච්චිකට්ටුව | ආරච්චිකට්ටුව | 11 | 2022.05.27 පෙ.ව. 10.30 | 1,000 |
| ආරච්චිකට්ටුව | බත්තුළුඔය | 12 | 2022.05.27 පෙ.ව. 10.30 | 1,000 |

04-928

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - වෙන්නප්පුව**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2022/2023

2022 ජූලි මස 01 වැනි දින සිට 2023 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකට ම අදාළව එවකට පවත්වන කොන්දේසි මාලාවන්ට යටත්ව පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක සකස් විය යුතු වන අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල පරිමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක .......................... දරන .............................................. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ පරිදි තැබෑරුම් අංකය සහ නම සඳහන් කොට 2022 මැයි මස 18 වැනි දින සිට මැයි මස 31 වැනි දින දක්වා 2022 මැයි 31 වැනි දින පෙ. ව. 10.30 ට පෙර වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට, පෙර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පනවා ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ/ *ගැසට් පත්‍රයෙන්* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2022.05.31 වැනි දින පෙ.ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් හෝ නිසි පරිදි බලයලත් නියෝජිතයින් වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2022.07.01 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ද ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(0315679170)

යූ. එස්. එන්. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 1. | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තඹරවිල | 2022.05.31 පෙ. ව. පෙ.ව. 10.30 | 500 0 |
| 2. | එම | නන්ජුන්ඩන්කරය | එම | 250 0 |
| 3. | එම | වයික්කාල | එම | 1,000 0 |
| 4. | එම | බොරලැස්ස | එම | 500 0 |
| 5. | එම | දුම්මලදෙනිය | එම | 1,000 0 |
| 6. | එම | උල්හිටියාව | එම | 500 0 |
| 7. | එම | ලුණුවිල | එම | 500 0 |
| 8. | එම | වෙන්නප්පුව | එම | 2,000 0 |
| 9. | එම | නයිනමඩම | එම | 1,000 0 |

| *තැබෑරුම් විවෘත කරන වේලාව -* | *තැබෑරුම් වැසිය යුතු වේලාව* |
|---|---|
| පෙ. ව. 10.00 | ප. ව. 2.00, |
| ප. ව. 5.00 | ප. ව. 9.00. |

04-936

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාලබේ ''ඔර්කිඩ් බයි නිවාසී'' අංක 92 හි වාසනා බණ්ඩාර කෞශල්‍යා හේරත් සේනාසේකර වන මා විසින් නුගේගොඩ, ඇඹුල්දෙණිය, සන්තානම්පිටිය පාරේ, අංක 21 හි උරෙශ් නොලින්ද සෝනාසේකරට ඇටර්නි බලය පැවරූ 2008.01.01 දින කේ. ඒ. පී. ගුණතිලක ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කළ ඇටර්නි බලපත්‍ර අංක 218 මෙයින් අවලංගු කරමි.

මෙම නිවේදනය පළ වූ පසු ඔහු විසින් ඇටර්නි බලපත්‍ර අංක 218 භාවිතා කොට කරන ක්‍රියා මා විසින් අනුමත නොකරන අතර ඒ සඳහා මගේ වගකීමක් ද නැත.

වාසනා බණ්ඩාර කෞශල්‍යා හේරත් සේනාසේකර.

04-724

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

කඩවත, රන්මුතුගල, සීතා වත්ත, අංක 427/ 1/10 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 931503804 V දරන රොෂාන් චානක ඩයස් වන මම ප්‍රසිද්ධ නොතාරිස් නුවන් චින්තක හෙට්ටිආරච්චි මහතා විසින් 2021 ජනවාරි මස 06 වැනි දින ලියා සහතික කරන ලද අංක 026 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් මාකොළ, මාකොළ උතුර, අංක 2/11, බී දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 923651942 V දරන බෝයගම හුනුගේ දසුන් දිල්රුක්ෂ යන අයට පවරා දෙන ලද ඇටර්නි බලය 2022 අප්‍රේල් මස 11 වැනි දින සිට අවලංගු කළ බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

රොෂාන් චානක ඩයස්.

04-856

---

## සීමිත සමාගම් ඒකාබද්ධ කිරීමේ පොදු නිවේදනය

කැළණිවැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී (සමාගම් අංක PQ58) සහ කැළණිවැලි ඉන්ස්ටන්ට් ටී (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක PV5303)

කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී (සමාගම් අංක PQ58), කැළණි වැලි ඉන්ස්ටන්ට් ටී (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක PV5303) යන සමාගම් ද්විත්වය 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 ඡේදයේ සඳහන් කොන්දේසි පරිදි තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව, සමාගම් පනතේ 242 (3) (b) වැනි ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද නව සමාගමේ නාමය කැළණිවැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී වන අතර සමාගම් ලියාපදිංචි කිරීමේ ජෙනරාල්වරයා විසින් ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කරනු ලබන දිනයේ දී ඒකාබද්ධ කිරීම ක්‍රියාත්මක වේ.

ඒකාබද්ධ වීමෙන් පසු කැළණිවැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී හි ලියාපදිංචි කාර්යාලය, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 ලෙස දක්වේ.

සමාගම් ඒකාබද්ධ කිරීමේ යෝජනාව අදළ සමාගම් හි ඕනෑම කොටස් හිමියෙකුට, ණය හිමියෙකුට හෝ ඒ සඳහා බැඳී සිටින ඕනෑම අයෙකුට, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 ස්ථානයේ දී සාමාන්‍ය කාර්යාල වේලාවන්හි පරීක්ෂා කළ හැක.

කැළණිවැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී,<br>
කැළණි වැලි ඉන්ස්ටන්ට් ටී (ප්‍රයිවට්) ලිමිටඩ්,<br>
අධ්‍යක්ෂ මණ්ඩලයන් හි නියමය පරිදි,<br>
හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,<br>
ලේකම්වරු.

අංක 400, ඩීන්ස් පාර,<br>
කොළඹ 10.<br>
2022 අප්‍රේල් මස 08 වැනි දින.

04-858

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නාවල, කොස්වත්ත පාර, අංක 83 යන ලිපිනයේ පදිංචි (විදේශ ගමන් බලපත්‍ර අංක 2414043) හිමි අලී ඉස්මයිල් වන මම, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ශාන්ති තෝමස් විසින් ලියා සහතික කළ අංක 3799 හා 2018.06.12 දින දරන ඇටර්නි බලපත්‍රය මගින් 3 Ellesmere Grove Cheltenham Glostershire GL 50 2QQ United Kingdom යන ලිපිනයේ පදිංචි වෛද්‍ය සුබෙයිර් සුලෙයිමාන් මහතා වෙත පවරන ලද ඇටර්නි බලය අද දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් දන්වා සිටිමි.

අලී ඉස්මයිල්.

04-784

**2007 අංක 7 දරන සමාගම් පනතේ 320 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි**

සී. අයි. සී. ඇග්‍රී බයෝටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්

**සමාගම් අංකය පීවී 2257**

***සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඈවර කිරීම***

සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඈවර කිරීමක් වශයෙන් මෙම සමාගම ඈවර කිරීමටත්, කොළඹ 03, පාසල් වීදියේ අංක 9-2/3, තුන්වන මහලේ වරලත් ගණකාධිකාරී සුමිත් රන්වත්ත සමාගමේ ඈවරකරු වශයෙන් වර්ෂ 2022 ක් වූ මාර්තු මස 22 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි පත් කිරීමටත්, කොළඹ 03, පාසල් වීදියේ අංක 9-2/3 තුන්වන මහලේ දී වර්ෂ 2022 ක් වූ මාර්තු මස 22 වන දින පවත්වනු ලැබූ මෙම සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමක දී 2007 අංක 7 දරන සමාගම් පනතේ (319) (1) (ආ) යටතේ යෝජනා සම්මතයක් අනුමත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 320 (1) දරන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුමිත් රන්වත්ත,
ඈවරකරු.

තුන්වන මහල, අංක 9-2/3, පාසල් වීදිය, කොළඹ 03.

04-786/1

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 346 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි**

සී. අයි. සී. ඇග්‍රී බයෝටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්

**සමාගම් අංකය පීවී 2257**

***ඈවරකරුවකු පත්කිරීමේ නිවේදනය***

වර්ෂ 2022 ක් වූ මාර්තු මස 22 වැනි දින පවත්වනු ලැබූ මෙම සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමක දී සී. අයි. සී. ඇග්‍රී බයෝටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඈවරකරු වශයෙන් සමාගමේ විශේෂ යෝජනා සම්මතයෙන් මා පත් කරන ලද බව කොළඹ 03, පාසල් වීදියේ අංක 9 -1/2 තුන්වන මහලේ වරලත් ගණකාධිකාරී සුමිත් රන්වත්ත වන මම මෙයින් නිවේදනය කරමි.

වරලත් ගණකාධිකාරී සුමිත් රන්වත්ත මහතා,
ඈවරකරු.

තුන්වන මහල, අංක 9-2/3, පාසල් වීදිය, කොළඹ 03.

04-786/2

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ජේඑස්අයිඩී ඇලුමිනම් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 00255777
ලියාපදිංචි කළ දිනය : 2022.04.01
ලියාපදිංචි ලිපිනය : 30/1ඒ, පහලකරගහමුන, කඩවත.

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
නීතිඥ,
සමාගම් ලේකම්.

ජේඑස්අයි ඇලුමිනියම් (ප්‍රයිවට්) ලිමිටඩ්.

04-924

---

**ඇටර්නි බලය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල, මීපිටිය, අංක 684 හි පදිංචි උඩවෙල හේවගේ රෝහන ජිනචන්ද්‍ර ද සිල්වා නොහොත් උඩවෙල හේවගේ ලාල් සිල්වා (ජා. හැ. අංක 680720495 V) යන ඇටර්නි අධිපති වන මා විසින් 2014.12.15 වැනි දින කෑගල්ලේ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් පුෂ්පක ශ්‍රී ලාල් දයානන්ද මහතා විසින් ලියා සහතික කළ අංක 639 දරන ඇටර්නි බලපත්‍රයෙන් කෑගල්ල, පොල්ගහවෙල පාර, පානකාව 02, බී 2/29 හි පදිංචි වෛද්‍යරත්න හේරත් මුදියන්සේලාගේ අචිනි තාරකා ජයවික්‍රම (ජා. හැ. අංක 856881326 V) යන අය මාගේ ඇටර්නි බලකරු ලෙසට පත් කරන ලද ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කළ බැව් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තව ද, ඉහත කී වෛද්‍යරත්න හේරත් මුදියන්සේලාගේ අචිනි තාරකා ජයවික්‍රම යන අය විසින් මින් ඉදිරියට මාගේ ඇටර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම ගණුදෙනුවකට හෝ ක්‍රියාවකට මා වග නොකියන බව ද තවදුරටත් දන්වා සිටිමි.

යූ. එච්. ලාල් ද සිල්වා,
උඩවෙල හේවගේ රෝහන ජිනචන්ද්‍ර ද සිල්වා
නොහොත් උඩවෙල හේවගේ ලාල් සිල්වා.

04-930

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

දෙහිවල, අත්තිඩිය ප්‍රධාන පාර, 4 වන පටුමග, අංක 268/7B දරන ස්ථානයෙහි පදිංචිව සිටි දූනට ඇමරිකා එක්සත් ජනපදය, නිව්යෝර්ක්, ස්ටැර්ටර්න් අයිලන්ඩ් 10301 ඇවෝන් පෙදෙස, අංක 60 හි පදිංචි අජිත් ප්‍රියංකර හේනොගොඩ විතානච්චි (ජා. හැ. අංක 671770480 V සහ විදේශ ගමන් බලපත්‍ර අංක එන් 5428404) වන මා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ඩී. රණගල මහත්මිය කෙටුම්පත් කරන ලද ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් රිච්මන්ඩ් හි ලියා සහතික කරන ලද රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ බස්නාහිර පළාත් කලාප කාර්යාලයේ 2018.05.14 දින දිනපොත් අංක 2462 පත්තිරු අංක 74 දරන සහ වෙළුම අංක 220 දරන විදේශ විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් දෙහිවල, අත්තිඩිය ප්‍රධාන පාර, 4 වන පටුමග අංක 268/7 බී දරන ස්ථානයෙහි පදිංචි මාගේ නැන්දම්මා වූ ජෙනිෆර් මොරින් වැන් ට්විස්ට් මහත්මිය (ජා. හැ. අං. 516242078 V) යන අය පත් කළ අතර වර්ෂ 2022.04.19 වැනි දින පටන් බල පැවැත්වෙන පරිදි එකී විදේශ විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් පවරන ලද බලය අවලංගු කර ඇති බව මහජනතාවට මෙයින් දූනුම් දෙන අතර, මාගේ ඇටර්නි බලකරු වශයෙන් ඇය විසින් මෙතැන් පටන් කරන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ද මෙයින් දූනුම් දෙමි.

අජිත් ප්‍රියංකර හේනොගොඩ විතානච්චි.

2022 අප්‍රේල් මස 19 වැනි දින.

04-1032

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

2022 ක් වූ අප්‍රේල් මස ගම්පහ, අලුත්ගම, නො. 109 හි පදිංචි ජා. හැ. අංක 198783701615 හිමි සමරසුන්දර සෙනෙවිරත්න මුහන්දිරම්ගේ මධුෂානි චාමරි සෙනෙවිරත්න වන මා විසින් ජා-ඇල, තුඩැල්ල, සිංහසල පාර, අංක 618/බී හි පදිංචි ජා. හැ. අංක 199128101646 හිමි අකිල එරන්ද විමලසූරිය යන අය වෙත බලය පවරමින් වර්ෂ 2020ක් වූ ජුනි මස 06 වැනි දින ගම්පහ පදිංචි යූ. ජී. ටී. ආර්. රණතුංග ප්‍රසිද්ධ නොතාරිස් මහතා ඉදිරියේ අත්සන් කළ අංක 455 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ශූන්‍ය කර බලරහිත කර සිටිමි. මෙතැන් සිට අකිල එරන්ද විමලසූරිය යන අය මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුළත් වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් මා වගකියනු නොලබන බව ද මෙයින් දූනුම් දෙමි.

එස්. එස්. එම්. එම්. චාමරි සෙනෙවිරත්න.

04-1038

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, වලහන්දූව, කුරුදුවත්ත ''සිරිලෙන'' දරන ස්ථානයේ පදිංචි නදිජ කමල් වික්‍රමනායක (ජා. හැ. අංක 672213096) වන මා සියල්ලන්ගේ ම දූනගැනීම පිණිස මෙයින් දන්වා සිටින වග නම්, මා විසින් අත්සත් කළ ගාල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර පොතේ 01 කාණ්ඩයේ 54 පත් ඉරුවේ 152 දිනපොතේ අංකය යටතේ 1998.12.14 දින ලියාපදිංචි කරන ලද අංක 6042 සහ 1998.09.30 දිනැති ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. පී. එම්. ජයවර්ධන විසින් සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය මගින් වලහන්දූව, කුරුදුවත්ත දරන ස්ථානයේ පදිංචි නලින් දමිත් වික්‍රමනායක යන අයට ලබා දී තිබූ ඇටර්නි බලයන් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කර නිශ්ප්‍රභා කර බල රහිත කරන බවත් එකී ලේඛණ මෙතැන් පටන් බලපැවැත්වීමක් නොවන බවත් එකී බලපත්‍ර යටතේ මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දූනුම් දෙමි.

නදිජ කමල් වික්‍රමනායක.

2022 අප්‍රේල් මස 19 වැනි දින,
සිරිලෙන,
කුරුදුවත්ත,
වලහන්දූව.

04-1040

---

## ප්‍රසිද්ධ දූන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව සහ 8 වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව මාස් බ්‍රෑන්ඩ්ස් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ නම, 2022 අප්‍රේල් මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අමන්තෙ එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් නම වෙනස් කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ කලින් තිබූ නම : මාස් බ්‍රෑන්ඩ්ස් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පීවී 118202
ලියාපදිංචි ලිපිනය : අංක 199, කඩුවෙල පාර, බත්තරමුල්ල
සමාගමේ නව නාමය : අමන්තේ එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

කෝපෙරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
අමන්තේ එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

04-1089

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය සහ 8 වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව මර්ලින් ෆිෂින් (පීවීටී) එල්ටීඩී සමාගමේ නම, ඔටෝනෙටික් හෝම් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස වෙනස් කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ කලින් තිබූ නම : මර්ලින් ෆිෂින් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පීවී 102768
ලියාපදිංචි ලිපිනය : අංක 10බී1, 3 වැනි කුළුණ, 320, යූනියන් පෙදෙස, කොළඹ 02
සමාගමේ නව නාමය : ඔටෝනෙටික් හෝම් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපොරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
ඔටොනෙටික් හෝම් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

04-1090

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව සහ 8 වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව මාස් බ්‍රෑන්ඩ්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ නම, 2022 අප්‍රේල් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි අමන්තේ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් නම වෙනස් කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ කලින් තිබූ නම : මාස් බ්‍රෑන්ඩ්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 87382
ලියාපදිංචි ලිපිනය : අංක 199, කඩුවෙල පාර, බත්තරමුල්ල.
සමාගමේ නව නාමය : අමන්තේ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

කෝපොරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
අමන්තේ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

04-1091

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 07, කුරුඳුවත්ත, රීඩ් මාවත, අංක 10/1 සහ දැනට රාජගිරිය, බුත්ගමුව පාර, ෆෙයාර්මවුන්ට් රෙසිඩන්සීස්, අංක 14සී හි පදිංචි මැදගොඩගේ තරිඳු විජයසේන (ජාතික හැඳුනුම්පත් අංක 821551358 V) වන මා විසින් කොළඹ - 07, රීඩ් මාවත, කුරුඳුවත්ත, අංක 10/1 යන ස්ථානයේ පදිංචි මැදගොඩගේ තරිඳු විජයසේන (ජාතික හැඳුනුම්පත් අංක 583010572 V) යන අය වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. නාරායනස්වාමි විසින් ලියා සහතික කළ අංක 4792 සහ 2012 සැප්තැම්බර් මස 11 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය 2022.04.25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ය කොට අවලංගු කරන ලද බවත් එකී බලකරු විසින් එකී බලපත්‍රය යටතේ කරනු ලබන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මා වග නොකියන බවත් ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට නොබැඳෙන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මැදගොඩගේ තරිඳු විජයසේන.

04-1100

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මීගමුව ශාඛාව**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව එලීනා සී ෆූඩ්ස් යන අය නාමය අභිධානය සහ ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ තනි අයිතිකරු වශයෙන් ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබන වත්තකුවත්ත වඩුගේ දිනේෂ් කුමාර යන අය ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කරන ලද දේපළ

**2022 ක් වූ මැයි මස 23 වැනි දින ප. ව. 2.00** ට දේපල පිහිටි ස්ථානයේ දී ආරම්භ වන ප්‍රසිද්ධ වෙන්දේසියේ දී මා විසින් විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ)මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ මීගමුව මහා නගර සභා පරිපාලන සීමාව තුළ දකුණු කුඩාපාඩුව 73 සී ග්‍රාම නිලධාරි වසම තුළ ඒත්තුකාලේ පිහිටි මඤ්ඤොක්කාගේ හේනවත්ත සහ මඤ්ඤොක්කා හේන, දවටගහවත්ත නමැති බෙදා වෙන් කරන ලද අංක 6745/1 දරන පිඹුරේ දක්වෙන බෙද වෙන් කරන ලද ඉඩම් කොටස, සහ ඊට අයත් ගොඩනැගිලි ගහ කොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 17.

*දේපළට පිවිසීම*- මීගමුව නගරයේ සිට හලාවත පාරේ කි. මී. 1.5ක් පමණ පෙරියමුල්ල දක්වා ගමන් කර මෙහිදී වමට හැරී එඩ්නිවස් (Adneves road) සහ කනත්ත පාරේ මීටර් 800 ක් පමණ ගමන් ගෙන දකුණට හැරී දොන් බොස්කෝ පාරට පිවිස එම පාරේ මීටර් 300ක් පමණ ගමන් කර නැවත දකුණට හැරී ශාන්ත සෙබස්තියන් පෙදෙසට හැරී එම පාරේ මීටර් 200ක් පමණ ගමන් ගත් පසු අදල දේපළ මෙම පාරේ දකුණු පසින් පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.07.26 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2019.08.09 වැනි දින මව්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* .- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න* : ජ්‍යෙෂ්ඨ කළමණාකරු (වාණිජ අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661835, 011-2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක ජංගම : 071 4962 449/071 8 446 374/076 1375 993.

04-983

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - නෙල්ලිඅඩි ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව කොරල් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කරන ලද දේපළ

**2022 ක් වූ මැයි මස 23 වැනි දින පෙ. ව. 11.00** ට දේපල පිහිටි ස්ථානයේ දී ආරම්භ වන ප්‍රසිද්ධ වෙන්දේසියේ දී මා විසින් විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ මැද පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ ගම්පහ

නගර සහා සීමාව තුළ බෙන්ඩියමුල්ල නැගෙනහිර අංක 234 ඒ ග්‍රාම නිලධාරි වසම බෙන්ඩියාමුල්ල ගමේ පිහිටි ''දෙල්ගහවත්ත'' නමැති ඉඩමට සහ පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු එස් පී ආර් පතිරාජ විසින් 2012.10.23 වැනි දින සාදන ලද අංක 5491 බී දරන පිඹුරේ ලොට් 01 සහ ලොට් 02 (බලයලත් මිනින්දෝරු ඒ. සී. එල්. පී. අතුකෝරළ විසින් 1998.10.23 වැනි දින සාදන ලද අංක 314 දරන පිඹුරේ ලොට් 01 සහ ලොට් 02 හි නැවත මැන බෙද වෙන් කරන ලද) ලෙස දක්වෙන බෙද වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඊට අයත් ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය ලොට් 01 රූඩ් 01 පර්චස් 37.20
ලොට් 02 පර්චස් 17.80 (මුලු ප්‍රමාණය රූඩ් 02 පර්චස් 15)
(මෙම දේපළ ගම්පහ කොළඹ පාර වරිපනම් අංක 431 ලෙසින් හඳුනා ගත හැක)

යෝජනා සම්මුතිය සඳහා 2021.04.01 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2021.04.19 වැනි දින මව්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* .- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න* : ජෝෂ්ඨ කළමණාකරු (වාණිජ අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661835, 011-2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 071 4962 449/071 8 446 374.

04-982

**අමානා බැන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ අමානා බැන්ක් පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව කච්චි මොහොමඩ් නජීම් යන අය බන්ධනදයි වශයෙන් අමානා බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී **2022 ක් වූ මැයි මස 25 වැනි දින පෙ. ව. 10.00 ට** මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ විස්තරය.-*
අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොතුවිල් ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අංක ඒපී/25 ඌරණි ග්‍රාම නිලධාරි වසම ඇතුලත ඌරණි ගමේ පිහිටි ඌරණි කාඩු (ටීපී 178889 පිඹුරේ කොටසක්) නමැති ඉඩමට බලයලත් මානක පී. තර්මේන්ත්‍රම් විසින් සාදන ලද 2017.06.24 වැනි දින අංක පීටී 213 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : අ. 02, පර්. 18.7

*දේපළට පිවිසීම.* - පොතුවිල් නගරයේ ඔරලෝසු කණුව අසල සිට අක්කරෙයිපත්තු පාරේ කි. මී. 6.9ක් පමණ ඌරණි පාලම පසුකර මීටර් 400ක් ගමන් ගත් පසු දකුණු පසින් හමුවන තුන් වන පාරට පිවිස එම පාරේ මීටර් 400ක් පමණ හතරමං හන්දිය පසුකර ගමන් ගත් පසු අදාළ දේපළ මෙම පාරේ වම් පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.01.22 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2021.01.22 වැනි දින දිවයින, ඩේලිමිරර්, හා තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* .- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු සහ වෙනත් ගාස්තු ඇත්නම් එම මුදල,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය සහ අනෙකුත් ගාස්තු,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත්

ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත අමානා බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු වේ.

